# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1909/54 - 2015 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2015.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් 2015 ජනවාරි මස 18 වැනි දිනැති අංක 1897/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය 2015 මාර්තු මස 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති

2015 අප්‍රේල් මස 10 වැනි දින
ජනාධිපති කාර්යාලය
කොළඹ 01

1A - PG 1509 — 406 (2015/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

(1) එම නිවේදනයෙහි ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍ය (අංක 3) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 13, 14, 15, 23 සහ 38 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(2) එම නිවේදනයෙහි රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය (අංක 8) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(8) රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි II වැනි හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ විෂයයන් සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
2. ඒකාබද්ධ සේවා පරිපාලනය කිරීම
3. ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්
4. පහත සඳහන් දීපව්‍යාප්ත සේවාවන්හි පරිපාලනය හා පිරිස් කළමනාකරණය
   - ශ්‍රී ලංකා පරිපාලන සේවය
   - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
   - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
   - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
   - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
   - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
   - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
5. රාජ්‍ය සේවා පුහුණුව
6. ජාතික එලදායීතාවය ඉහල නැංවීම පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
7. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතාව පිළිබඳ සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
8. විශ්‍රාම වැටුප් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම
9. රජයේ සියලුම විශ්‍රාම වැටුප් ක්‍රම සම්බන්ධ කටයුතු
10. රජයේ නිල නිවාස වෙන් කරදීම හා පරිපාලනය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්
3. එලදායිතා ලේකම් කාර්යාලය
4. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
5. රාජ්‍ය භාෂා කොමිසම
6. භාෂා අධ්‍යාපන පුහුණුව පිළිබඳ ජාතික ආයතනය
7. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
8. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල
9. දේශීය ණය සහ සංවර්ධන අරමුදල
10. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු පනත්*

- අනිවාර්ය රාජ්‍ය සේවා පනත
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනත (1982 අංක 9)
- රාජ්‍ය භාෂා පනත (1956 අංක 33)
- රාජ්‍ය භාෂා කොමිසම පනත (1991 අංක 18)
- ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත (2007 අංක 26)
- වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත
- වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත
- වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත
- රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත (1999 අංක 40)
- රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීම) පනත
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ආඥාපනත
- තෑගි පිරිනැමීමේ තරග පනත (1957 අංක 37)
- මහනගර සභා ආඥාපනත
- ප්‍රාදේශීය සභා පනත (1987 අංක 15)
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනත
- නගර සභා ආඥාපනත

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 11. අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම පිණිස රාජ්‍ය තන්ත්‍රය තුළ යහපාලනය ප්‍රවර්ධනය කිරීම<br>12. නවීන යහපාලන සංකල්ප හඳුන්වාදීම<br>13. ශක්තිමත් හා බලවත් පුරවැසියන් බිහිකිරීම පිණිස ජනතා අපේක්ෂාවන්ට මුල්තැන ලබාදෙන රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම<br>14. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්<br>15. පොදු පහසුකම් කාර්යයන් සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබාදීම<br>16. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම<br>17. පළාත් පාලන පරිපාලනයට සම්බන්ධ සියලුම අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම<br>18. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්<br>19. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | ■ දේශීය ණය සහ සංවර්ධන අරමුදල පනත (1916 අංක 22)<br>■ දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

(3) එම නිවේදනයෙහි කර්මාන්ත හා වාණිජ අමාත්‍ය (අංක 23) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 11 සහ 12 වැනි අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි 8, 14, 28, 33, 34 සහ 35 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- ■ පේෂ කර්මාන්ත අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථාන පනත (1984 අංක 3)
- ■ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)
- ■ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)

(4) එම නිවේදනයෙහි නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණ හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය (අංක 25) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(25) නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණ හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය" වශයෙන් ;

(5) එම නිවේදනයෙහි මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍ය (අංක 31) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි I අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

"1. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව "

(6) එම නිවේදනයෙහි නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍ය (අංක 39) ශීර්ෂයේ I වැනි II වැනි හා III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂයන් ඇතුළත් කිරීමෙන් :-

**(40) පළාත් සභා සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 1. පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම<br>2. පළාත් සභා සම්බන්ධ සියලුම කටයුතු<br>3. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම<br>4. පළාත් සභා පරිපාලනයට සම්බන්ධ සියලුම අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම | | ■ පළාත් සභා පනත (1987 අංක 42)<br>■ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) පනත (1988 අංක 37)<br>■ දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I තීරුවෙහි සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**(41) ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 1. ග්‍රාමීය ආර්ථික කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනවලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම<br>2. ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය<br>3. ග්‍රාමීය මට්ටමේ කුඩා ව්‍යාපාර සංවර්ධනය<br>4. අත් යන්ත්‍ර, පේෂකර්ම සංවර්ධන කටයුතු<br>5. ජාතික ශිල්ප හා කලා සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම<br>6. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම<br>7. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්<br>8. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | 1. ග්‍රාමීය පුණර්ජීවන අරමුදල<br>2. ග්‍රාමීය ආර්ථික පුණර්ජීවන අරමුදල (මූල්‍ය)<br>3. ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල)<br>4. ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය<br>5. පේෂ කර්මාන්ත පුහුණු කිරීමේ සහ සේවා මධ්‍යස්ථානය<br>6. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව<br>7. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය<br>8. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)<br>9. ජාතික මෝස්තර මධ්‍යස්ථානය<br>10. ජාතික ශිල්ප සභාව | ■ ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)<br>■ පේෂ කර්මාන්ත අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය පනත (1984 අංක 03)<br>■ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)<br>■ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)<br>■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II වැනි තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**(42) විශේෂ ව්‍යාපෘති අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 1. කඩිනම් අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂ වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | |
| 2. අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන විශේෂ ව්‍යාපෘති අදාළ අනෙකුත් අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණයකින් යුක්තව සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 3. විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් අමාත්‍යවරුන්ට සහායවීම | | |
| 4. වකුගඩු රෝග පාලනය සහ වැළැක්වීමට අදාළව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සහ ව්‍යාපෘති අදාළ අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණය | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.